# සාමාන්‍ය සමයේ දස සතරවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය — සෙකරියා 9: 9–10

*සෙකරියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබේ රජතුමාණෝ යටහත් සිතින් ඔබ වෙත වඩින සේක."

සියොන් පුරගත, ප්‍රීති ප්‍රමෝද වන්න: ජෙරුසලම් පුරගත සොම්නස් හඬ නගන්න. ඔබේ රජතුමාණෝ ඔබ වෙත වඩින සේක. එතුමාණෝ ජයාන්විත විජයශ්‍රීයෙන් පැමිණෙන සේක. යටහත් සිතින් කොටළුවෙකු පිට නැග, එසේය, කොටළු දෙනකගේ පිට නැග පැමිණෙන සේක. මම ඒප්‍රායිම් කෙරෙන් රථය ද ජෙරුසලමෙන් අශ්වයන් ද සිඳදමන්නෙමි. යුද්ධ දුන්න ද කපා හරිනු ලැබේ. උන් වහන්සේ ජාතීන්ට සාමදානය ප්‍රකාශ කරන සේක. උන් වහන්සේගේ ආණ්ඩුව මුහුදෙන් මුහුදටත් යුප්‍රටීස් ගංගාවේ පටන් පොළොවේ සීමා දක්වාත් වන්නේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 145: 1–2, 8–11, 13–14

පිළිතුර : අපගේ දෙවි රජිඳුනි, සදාකල්ම අපි ඔබ පසසමු.

ගීය : මා දෙවි රජිඳුනි, ඔබ ගුණ මම ගයමි. ඔබ නම සදාකල් ම පසසමි.
සැම දා ඔබට තුති පුදමි: සදාකල් ඔබ නම පසසමි.
සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය:
වහා නොකිපෙන සුලු ය. තිරසර පෙමින් යුතු ය.

සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක.
එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ල ද වෙත පැතිරෙයි.
සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි:
ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.

ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබේ බල මහිමය ගැන ද කතා කරති.
ඔබේ රාජ්‍යය සදාකාලික ය, ඔබේ ආධිපත්‍යය ද
සියලු පරම්පරාවල ම පවත්නේ ය.
සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක.

තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක.
වැටෙන දුබලුන් හට සමිඳාණෝ ආධාරකරන සේක.
නැමී සිටින සියල්ලන් කෙළින් සිටුවන සේක.

## දෙවන දේව ප්‍රකාශනය — රෝම 8: 9, 11–13

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"ආත්මයාණන් මගින් මාංසික ක්‍රියා නසන්නාහු නම්
ඔබ සැබැවින් ම ජීවත් වන්නහු ය."

"එහෙත් දෙවියන් වහන්සේගේ ආත්මයාණෝ සැබැවින් ම ඔබ තුළ වාසය කරන සේක් නම්, ඔබ ජීවත් වන්නේ මාංසික තෘෂ්ණාවල නොව ආත්මයාණන් තුළ ය. යම් කෙනෙකුට ක්‍රිස්තුන් වහන්සේගේ ආත්මයාණන් නැති නම්, ඔහු උන් වහන්සේට අයිති නැත. තවද, ජේසුස් වහන්සේ මළවුන් කෙරෙන් උත්ථාන කළ තැනැන් වහන්සේ ඔබ තුළ වැඩ වසන සේක් නම්, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මළවුන් කෙරෙන් උත්ථාන කළ තැනැන් වහන්සේ ඔබ තුළ වසන ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන ඔබගේ මරණීය ශරීර ජීවමාන කරන සේක.

එබැවින් සහෝදරවරුනි, මාංසයට ගැති ව ජීවත් වීමට අප මාංසයට බැඳී නැත. ඔබ මාංසයට ගැති ව ජීවත් වන්නහු නම් මරණයට පත් වනු ඇත. එහෙත් ආත්මයාණන් මගින් ඔබ මාංසික ක්‍රියා නසන්නහු නම්, ඔබ සැබැවින් ම ජීවත් වන්නහු ය."

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද — මතෙව් 11: 25

ආලේලූයා! ආලේලූයා!
“ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් වන
පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු
පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට
බාලයන්ට අනාවරණය කළ හෙයින්
ඔබට තුති පුදමි”යි
ස්වාමීන් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය — මතෙව් 11: 25–30

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

“මම හෘදයෙන් ගුණවත් මෘදු නිහතමානි කෙනකු වෙමි.”

ඒ අවස්ථාවේ දී ජේසුස් වහන්සේ උත්තර දෙමින් මෙසේ වදාළ සේක. “ස්වර්ගයටත් පොළොවටත් ස්වාමීන් වන පියාණන් වහන්ස, ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා නැණවතුන් කෙරෙන් ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි. එසේ ය, පියාණෙනි, ඔබට ප්‍රිය මනාප එය ම ය. මාගේ පියාණන් වහන්සේ සියල්ල මට පවරා දී ඇත. පියාණන් වහන්සේ හැර, අන් කිසිවෙක් පුත්‍රයාණන් නොහඳුනති. පුත්‍රයාණන් සහ පියාණන් වහන්සේ එළිදරව් කිරීමට පුත්‍රයාණන් විසින් තෝරාගනු ලැබූ යමෙක් වේ ද, ඔහු හැර අන් කිසිවෙක් පියාණන් වහන්සේ නොහඳුනති. වෙහෙස වන, බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න, මම ඔබට සහනය දෙමි. මා ගුණ වත්, මෘදු, නිහතමානි කෙනෙකු බැවින් මාගේ වියගහ කරට ගෙන මාගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනය ලැබෙනු ඇත. මාගේ වියගහ පහසු ය. මාගේ බර ද සැහැල්ලු ය.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*